

## දහම් දෙසන්නට පෙරුම් පුරනවද පොඩි හාමුදුරුවනේ ?

### බුදු සිරිත මහිම හෙළි කළ අජන්තා බිතු සිතුවම්

'බෞද්ධ කලා නිර්මාණ' විශේෂාංගය යටතේ ඉන්දියාවේ ලෝක ප්‍රකට අජන්තා බිතු සිතුවම් පිළිබඳ පුරා විද්‍යාත්මක තොරතුරු ඇතුළත් ලිපියකි.

### මෙලොව ජයගත හැකි කරුණු හතරක්

– වේවැල්වත්තේ සීලතිස්ස හිමි

සුප්‍රකට බෞද්ධ ග්‍රන්ථයක් වන ධම්මපදයෙහි ගාථාවක් ඇසුරෙන් ක්‍රෝධ නොකිරීමෙහි – මසුරු කමෙන් තොරවීමෙහි හා සත්‍ය වචන භාවිතා කිරීමෙහි යහපත් ප්‍රතිඵල පිළිබඳ විමසුමක් – ඉල් අව අටවක පෝද ධර්ම දේශනාවෙන්.

### සිතෙන් පොහොසත් වූ දුගියාගේ කතාව දළිද්ද සූත්‍රයෙන් පාඩමක්

– ලයනල් මදවන්ආරච්චිගේ

දිළිඳු මනුෂ්‍යයකු දහමෙහි දැක්වෙන ගුණ දහම් වැඩීමෙන් සුගතියක් (සුවපත් ජීවිතයක්) ලබාගත් ආකාරය සඳහන් වන සූත්‍ර දේශනාවකට අර්ථ විවරණයක්.

### බටහිර ලෝකයට දහම් හඬ පැතිර වූ ධර්ම දූතයාණෝ

– බන්දුල ආර්. ගුලවත්ත

'පූජිත ජීවිත' විශේෂාංගය යටතේ මාතර වැල්ලබඩ පත්තුවේ පරවාහැර නමැති ප්‍රදේශයේ උපත ලැබ – දහසය වැනි තුරුණු වියේ දීම පැවිදි බව ලැබ දෙස් – විදෙස් හි සුවිශාල ධර්ම ප්‍රචාරයක යෙදෙමින්, අගනා ශාසනික මෙහෙවරක යෙදී 1970 වසරේ දී අපවත් වූ මහා තෙර නමක් පිළිබඳ විස්තර දැක්වෙන ලිපියකි.

### අදහම් අඳුරට සදහම් එළියක්

– ඒ. එම්. ප්‍රේමරත්න

එක් අතකින් බෞද්ධ ප්‍රබෝධයකුත්, තවත් අතකින් සාරධර්ම පරිහානියකුත් පෙන්වන වර්තමාන සමාජයේ – එම ප්‍රවණතා වලට සමාජ විමර්ශනයක් සිදු කිරීම තුළින් හේතු විග්‍රහ කිරීමට හා ඊට විසඳුම් යෝජනා කිරීමට ලේඛකයා උත්සාහ දරයි.

### ජාතක කතාවෙන් හෙළි වූ දහම් මග ප්‍රායෝගිකත්වය

– තිලක් පුෂ්පකුමාර සේනානායක

ජාතක කතා තුළින් ප්‍රකට වන බෞද්ධ ඉගැන්වීම්වල ප්‍රායෝගිකත්වය, ජාතක සාහිත්‍යය පිළිබඳ විමර්ශනාත්මක කෙටි ලිපියකි.

### මග – ඵල ලැබීම සිහිනයක් නොවේ – 6

– දෙලොස්වල උදිතධීර හිමි

විමුක්ති ප්‍රතිපදාවේ ඉහළ බුද්ධි මට්ටම්වලට පැමිණීම – වර්තමාන ජීවිතය තුළදීම ප්‍රායෝගික කරගත හැකි යථාර්ථයක් බව පැහැදිලි කැරෙන ලිපි පෙළක හය වැනි ලිපිය.

### යහපත් සමාජයක් උදෙසා සිරිතෙන් – විරිතෙන් දරුවන් දැනුවත් කරමු

– අමුවල අමරසේන

සමාජ සදාචාරයට රුකුල් දෙන බෞද්ධ සිරිත් – විරිත්වල ඇතුළත් දර්ශනික හරය. සාමයෙන් හා සෞභාග්‍යයෙන් සපිරි අනාගත සමාජයක් තැනීම සඳහා බොදු සිරිත් – විරිත් පිළිබඳ දරුවන් දැනුවත් කිරීමේ වැදගත්කම. ඇතැම් විදේශ රටවල චාරිත්‍ර ගැන ද විග්‍රහ කිරීමට ලේඛකයා උත්සාහ දරයි.

## ⌘ කඹුරුපිටියේ වනරතන මහ නාහිමි

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පුරා විද්‍යාව පිළිබඳ හිටපු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකි. පනාකඩුව තඹ සන්නස සොයා ගැනීමට මුල්වූහ. පුරා විද්‍යාව හා ඉතිහාසය පිළිබඳ කෘති රැසක් ලියා පළ කර ඇත. ශ්‍රී රෝහන සංඝ සභාවේ මහානායක මාහිමිපාණන් වහන්සේ වූහ.

## ⌘ කොග්ගල – කලාතුඩුව විවේක සේනාසනය

– තිත්තගල්ලේ මැටිවල පියදස

ගාල්ල – මාතර මාර්ගයේ කොග්ගල ගුවන් කඳවුරට හැරෙන තැන සිට ඇරඹෙන මාර්ගයේ කිලෝ මීටර් එකහමාරක් පමණ ගමන් කරන විට හමුවන සුන්දර පරිසරයක පිහිටි භාවනා මධ්‍යස්ථාන–යක් පිළිබඳ තොරතුරු.

## ⌘ ඓතිහාසික අභයගිරිය

– නිශාන්ත චමින්ද පීරිස්

‘චාරිකා සටහනක්’ විශේෂාංගය යටතේ ශ්‍රී ලංකාවේ ඉපැරණි දගැ–බක් වන; ‘අටමස්ථාන’ නමින් හැඳින්වෙන සුප්‍රකට බෞද්ධ සිද්ධස්–ථානවලින් එකක් වූ ‘අභයගිරිය’ චෛත්‍යය හා ඒ ආශ්‍රිත පුදබිම පිළිබඳ ඉතිහාසගත තොරතුරු.

## ⌘ බුදු ඇසින් දුටු සාමයේ අගය

– අතුරුගිරියේ වෛද්‍ය පිය ජය විතාන

සාමය පිළිබඳ විවිධ සංවාද ගොඩනැගෙමින් පවතින යුගයක – බෞද්ධ දර්ශනය තුළ ඒ පිළිබඳ දක්වෙන විග්‍රහය කෙබඳුදැයි විමසා බැලීමට දරන ප්‍රයත්නයකි

## ⌘ බෞද්ධ මූලධර්ම හෙළි කරන අධ්‍යාපන උපාය මාර්ග

– රෙජී වීරමන්

අධ්‍යාපන උපාය මාර්ග වශයෙන් බෞද්ධ මූලධර්ම යොදා ගැනීමට ඇති හැකියාව ගැන විමර්ශනයකි. අදාළ විෂය පිළිබඳ බටහිර මනෝ විද්‍යාව හා බෞද්ධ මනෝ විද්‍යාව අතර තුලනාත්මක විග්‍රහයක් ද මේ ලිපියට ඇතුළත් ය

## ⌘ Death is the prelude to birth

***-by Aryadasa Ratnasinghe***